# මහායාන බෝධිසත්ව සංකල්පය පිළිබඳ ප්‍රකටවන තිරියාය පර්වත ලිපිය.

පුස්තකාලයාධිපති වයි. තිස්ස බණ්ඩාර

ප්‍රවේශය -

බුදුසමයෙහි මහායාන සම්ප්‍රදයට අනුව බෝධිසත්ව සංකල්පය අතිශයින් ම දාර්ශනික පදනමක් මත පිහිටා ඇති අයුරු අදාළ සූත්‍ර ධර්ම අනුසාරව පැහැදිලි වන්නේ ය. මහායාන බුදුසමයෙහි පූජනීය ශුද්ධ ධර්ම ග්‍රන්ථ සේ සැලකෙන සූත්‍ර රැසක් අතුරින් ප්‍රධාන සූත්‍ර ධර්මයෝ නවයක් වෙති. එනම් 1. අෂ්ටසාහස්‍රිකා ප්‍රඥාපාරමිතා 2. සද්ධර්මපුණ්ඩරික, 3. ලලිතවිස්තර, 4. ලංකාවතාරසූත්‍ර, 5. ස්වර්ණප්‍රභාස, 6. ගණ්ඩව්‍යුහ, 7. තථාගතගුහ්‍යක, 8. සමාධිරාජ, 9. දශභූමිශ්වර යනුයි. බෞද්ධ ඉතිහාසයේ සුවිශේෂී තත්ත්ව රැසක් හිමි මහායාන ධර්මය විවිධ රටවල විකාශයට පත්ව තිබෙයි. මේ සම්බන්ධව බොහෝ විස්තර පළව ඇති අතර ඒ තුළ දාර්ශනික සංකල්ප, පඬිවරු, ලලිතකලාව, වාස්තුවිද්‍යාව, සාහිත්‍යය ආදිකොට ඇති බහුවිධ විෂයයෝ ගණනාවක් අන්තර්ගත වන්නේ ය. මේ බඳු කෙටි ලිපියකින් ඒවා සම්බන්ධයෙන් අංශුමාත්‍රයක ප්‍රමාණයක්

© පුස්තකාලයාධිපති වයි. තිස්ස බණ්ඩාර.

'නැණැස' ශාස්ත්‍රීය සංග්‍රහය - 2019, 16 කලාපය, (සංස්.) ජයන්තිපුර විමලරතන හිමි හා කොලොන්ගොඩ නන්දරතන හිමි, (සහාය සංස්.) වීරවිල පුඤ්ඤරතන හිමි හා ජයතුගම ධීරානන්ද හිමි (අස්ගිරිය මහාවිහාර මහ පිරිවෙණ), පිටු 423 - 443.

හෝ හෙළිකළ නොහැකි ය. ඒ එසේ වුයේ වුව ද මහායාන බෝධිසත්ව සංකල්පයට අයත්අවලෝකිතේෂ්වර බෝධිසත්ව සහ මංඤ්ජුශ්‍රී බෝධිසත්ව පිළිබඳව සඳහන් තිරියාය සංස්කෘත ශිලාලේඛනයෙන්හෙළිවන තොරතුරු බිඳක් මෙයින් එළි දක්වනු ලැබෙයි.

## පිහිටීම -

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතෙහි ත්‍රිකුණාමලය නගරයේ සිට උතුරට වන්නට වෙරළබඩ කලාපයට සමාන්තරව සැතපුම් 29ක් දුරින් තිරියායි ගම්මානය පිහිටා තිබෙයි. එම ග්‍රාමයේ සිට නැගෙනහිර පැත්තට සැතපුම් එකහමාරක් පමණ දුරින් වූ කඳුගැටයක් මත තිරියායි වටදගේ පිහිටයි. මුහුදු මට්ටමේ සිට අඩි 200ක් උස් වූ මෙම කඳුගැටය එමකලාපයට ආවේනික වු තුරුලතාවන්ගෙන් වැසී ඇත. එහි මුදුනේ ප්‍රධාන පූජනීය ස්මාරකය වූ වටදගෙය ද ඒ ආශ්‍රිතව පිළිමගෙවල් ද භාවනා හලක් ද වශයෙන් ගොඩනැගිලි කීපයක නටඹුන් දක්නට ඇත. විවිධ කාලයන්ට අයත් සංස්කෘතික සාධක මෙහි පවතී.[1] තිරියායි වටදගෙය ආශ්‍රිත පුදබිම ඓතිහාසික යුගයෙන් අනූන වූ ස්ථානයක් වන්නේ ය. මෙහි පිහිටීම අනුව නැගෙනහිරින් බෙංගාල බොක්ක සමුද්‍රයත් සෙසු පැතිවලින් රට තුළ මහ වනාන්තරය සහ ජනාවාස ආදිය හොඳින් පෙනේ.

## ස්ථානීය නටඹුන් -

ප්‍රධාන පිවිසුමෙන් පඩිපෙළ මතින් කඳු මුදුනට පිවිසීමේ දී වට ද ගේ ආකෘතියට ඉදිකළ ස්තුපය මෙහි ඇති ප්‍රධාන නටඹුන් ස්මාරකය වන්නේ ය. මෙ නටඹුන් ගල් පුවරුවලින් සැදුම්ලත් වට ප්‍රාකාරයකින් සමන්විත වන්නේ ය. නැගෙනහිර හා උතුරු දෙසින් වූ පිවිසුම් දෙක මුරගල් කොරවක්ගල් සඳකඩපහණ ආදී අතිරේක විසිතුරු උපාංගයන්ගෙන් යුක්ත වෙයි.මෙම ස්තුපයේ පතුලෙහි වටප්‍රමාණය අඩි 32යි අඟල් 6කි. පසුකාලීන සංරක්ෂණයක් නිසා මේ ප්‍රමාණයට වටප්‍රමාණය වැඩි වි ඇත. ඊට පෙරාතුව පැවති

1 Sirisoma, M.H. THE VATADAGE AT TIRIYAYA, Department of Archaeology, Colombo 7. 1983, P.1



තත්ත්ව අනුව මෙහි පැරණි වටප්‍රමාණය අඩි 25කි.[2] මේ කරුණු පැහැදිලි ය. තිරියායි වටද ගෙය පිළිබඳව පර්යේෂණය කළ සහ එම පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ වාර්තාවක මෙසේ සඳහන් වෙයි.ස්තූපයේ බඳකොටස කොඳුකැටයමින් යුත් පදනමක් මත පිහිටුවා ඇත. දැන් මෙය ප්‍රතිසංස්කරණය කර තිබේ. එය තනා තිබී ඇත්තේ කළුගල්වලිනි. එහි මූනතට ගඩොල් අල්ලා තිබිණ.දැන් එය මළුවේ මට්ටමින් අඟල් හතරක් යටට ඇත. ස්තූපය ලොකු කිරීමට යොදාගෙන ඇති ක්‍රමය මුල් ස්තූපය වසා වෙනම බැම්මක් බැඳීමය. මේ බැම්මට කැටගල් හා ගඩොල් කැබලි පාවිච්චි කර තිබේ. ස්තූපය හැරූ නිදන් හොරුන් එහි ගර්භය මුළුමනින් ම කොල්ලකා ඇත. එක් අගස්ති ඇටයක් පමණක් එහි සුන්බුන් අතර තිබී අපට හමුවිය. ධාතු ගර්භයක් තිබුණු බවට කිසි ලකුණක් වත් නොවීය.[3] තිරියායි නටඹුන් පිළිබඳව දීර්ඝ විස්තරයක් ආචාර්ය සෙනරත් පරණවිතාන සිය වාර්තාවේ අන්තර්ගත කැර තිබෙයි. තව ද බලන්න එම. මෙහි ඇති වටද ගේ පිළිබඳව විස්තර සැපයෙන තවත් වාර්තාවක් සඳහන් කරන්නේ ස්තූපයට අයත් වපසරියේ වටප්‍රමාණය අඩි 79ක් බවය. එමෙන් ම ස්තූපය වටා ඇති ගල්කුලුණු අනුරාධපුර ථූපාරාම දගැබට අයත් කුළුණු සහ මැදිරිගිරිය වටදගෙට අයත් කුළුණු හා සමාන බවත් දැක්වෙයි. එහෙත් අවසන් වරට දක්වන ලද ස්ථාන දෙකේ ගල්කුළුණු සහ තිරියායි වටදගේ ගල්කුළුණුවල විශේෂ වෙනසක් ඇති බවයි. එනම්, මේ ගල්කුළුණු ශීර්ෂ හා කණුව එකම ගලින් නිමවා ඇති ආකාරයයි. ථූපාරාමයේ ගල්කුළුණු ශීර්ෂ වෙනම සවිකළ ඒවා වන්නේ ය.[4] මෙහි පවතින නටඹුන් අතර දගැබ වටේ ඇති පිළිමගේ සයකි. ඒ එක් පිළිමගෙයක් තුළ ගඩොලින් ඉදිකළ බුදුපිළිමයක සාධක ද ඇත්තේ ය. අනුරපුර සහ පොළොන්නරුවේ වටදගෙවල් වෙත පිවිසීමට ඇති ආකාරයේ පිවිසුම් දොරටු ද මෙහි දක්නා ලැබෙයි. ඒ අතර සඳකඩපහණ, කොරවක්ගල හා මුරගල ද ඇත්තේ ය. මෙහි ඇති

2 එම.

3 පරණවිතාන සෙනරත්.- පුරාවිද්‍යා පරියේෂණ දෙවන මුද්‍රණය, 2001 (රත්නා පරණවිතාන) විසිදුනු, බොරලැස්ගමුව. පි. 209.

4 Sirisoma, M. H. 1983. P.2

ඇතැම් නිර්මාණ පල්ලව සම්ප්‍රදය අනුව සකසා තිබෙයි.[5] ස්තූපය වටා සිරිපතුල් ගල් ද ඇත්තේ ය. කඳුමුදුනට පිවිසීම සඳහා ඉදිකර ඇති ප්‍රධාන මාර්ගයේ වන්නා වූ ගල්පඩිපෙළ ද කලුගල් පුවරු භාවිතයෙන් නිමවා ඇත. මේවා ද නටඹුන් සේ සැලකෙයි. පර්වත මුදුනේ ඇති පැරණි පොකුණු දෙක ද ඓතිහාසික වැදගත්කමක් ඇති දෙයකි. පහළට වන්නට ද ගල් පුවරු අල්ලා කළ පොකුණු දෙකක් ද පිහිටා තිබෙයි. තිරියායේ පැරණි මාර්ගයකට සම්බන්ධ ගල්පාලම මෙහි ඇති තවත් සුවිශේෂී නටඹුන් සේ සැළකිය හැකිය.[6] තිරියායි ගල්පාලම ලංකාවේ පැරණි ගල්පාලම් අතරින් සිත්ගන්නා සුළු පාලමකි. ගල්කණු 30ක් මත හරහට යොදන ලද ගල් බාල්ක මත දික් අතට යෙදූ ගල් පුවරු මගින් මේ පාලම ඉදිකර තිබෙයි. දැනුදු භාවිත කළ හැකි මේ ගල් පාලම පුරාණයේ දී වෙරළබඩ තීරුව වෙත ගමන් කළ මාර්ගයක් ඔස්සේ ඉදිකර තිබෙන්නට ඇත. දැනුදු වර්ෂාව සමයේ මේ පාලමට යටින් දිය පහරක් ගලා බසී. එවකට මේ පාලම කොපමණ උසින් යුක්තවූයේ දැයි කිව නොහැකි ය. දැනට ගල්කණු යම් ප්‍රමාණයක් පසින් වැසී තිබෙනු පෙනෙයි.[7]

## සෙල්ලිපි -

තිරියායි වටදගෙය ආශ්‍රිත ප්‍රදේශයේ ඇති සෙල්ලිපි කීපයකි. ඉන් දෙකක් ක්‍රිස්තු පූර්ව දෙවැනි සියවසට අයත් පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි දෙකකි. එකක් ක්‍රිස්තුපූර්ව පළමුවන සියවසට අයත් ලෙන් ලිපියකි.[8] මෙයින් ක්‍රිස්තු පූර්ව දෙවැනි සියවසට අයත් ලිපියක් මෙසේ ය. "පරුමක උති ඝධිත ......... ලිය ලෙණෙ (ප්‍රමුති උත්තියගේ දුහිතෘ....ලෙණ)[9] මෙම ලිපියේ මැද කොටසක් මැකී ගොස් ඇත. ක්‍රි.ව. පළමු සියවසට අයත් ලෙන් ලිපිය සම්පූර්ණ වශයෙන් වාර්තා වෙයි. එය මෙසේ ය. "පිගල අනුඩිගේ ලෙණෙ

5 එම.

6 එම.

7 තිස්ස බණ්ඩාර, වයි. කේ.- නූතන තාක්ෂණයට අභියෝග කළඅපේ ගල්පාලම්. මව්බිම පුවත්පත බදාදා විශේෂ අතිරේකය, 2012.08.22, පි.7

8 Sirisoma, M. H. 1983. P.3

9 PARANAVITANA, S. INSCRIPTIONS OF CEYLON Vol. I. 1970 ARCHAEOLOGICAL SURVEY OF CEYLON, COLOMBO. P.29



චතු - දිසික සගස දිනේ (පිගල අනුඩිගේ ලෙණ සතර දිග සංඝයාට දෙනු ලදී)".[10] 'පිගල' යන්නෙන් රන්වන් පැහැය යන්න අර්ථවත් කරයි.[11] මෙහි ඇති තවත් ලිපියක් ස්තූප මලුවේ බිම ඇතිරූ ගල් පුවරුවක සටහන්කර තිබෙයි. "රක්සල් බතින් ලැවු පහණි" යන ලිපිය ක්‍රිස්තු වර්ෂ අටවෙනි සියවස නියෝජනය කරයි. එය එම ගල්ලැල්ල ඇතිරූ අයගේ ලියවිල්ලකි.[12] තිරියායේ ඇති සංස්කෘත පර්වත ලිපිය සුවිශේෂී ලිපියක් වන්නේ ය. ස්තූපයට අඩි 200ක් පමණ පහලින් පිහිටි ගල් තලාවක අඩි 20×5 ප්‍රමාණයේ පසුතලයක පේළි 11ක් වනසේ ලියා ඇති ලිපිය සංස්කෘත භාෂාවෙන් පල්ලව ග්‍රන්ථාක්ෂරයෙන් ලියා තිබෙයි. එකී ලිපිය ක්‍රිස්තු වර්ෂ හත්වන සියවසට අයත් වන්නේ ය.[13] මේ පිළිබඳව අන්තැනක විස්තර දැක්වෙයි.

## ඓතිහාසික පසුබිම -

තිරියායේ ඉතිහාසය ඈත අතීතයට ගෙනයන අතර ලක්දිව ස්තූප ඉතිහාසයේ නව පරිච්ඡේදයක් ඒ මගින් පෙරළෙයි. දැනට එහි දමිල වැසියන් විසින් මේ ඓතිහාසික ස්ථානය 'කන්දසාමි මලෙයි' යනුවෙන් හඳුන්වති. මේ අතර එහි වැසි සිංහලයෝ මෙතැන නිතුපත්පාන යයි හඳුන්වති. මේ නිතුපත්පාන යන වචනය අපගේ සිංහල නම් පොතේ ද ඇත. මෙම ස්ථානය ක්‍රිස්තුවර්ෂ අටවැනි සියවසේ දී පමණ කෙරුණු විහාරයකි. පූජාවලියේ ද වසභ රජු විසින් නිතුපත්පාන නමින් කළ වැවක් ගැන සඳහන් වෙයි. එහෙත් මෙය ගැන සැක කිරිමට හේතු ඇත්තේ ආදියේ මේ ස්ථානය "ගිරිකණ්ඩ චෛත්‍ය" වශයෙන් අඳුන්වා දී ඇති බැව් එහි තිබී සොයාගත් ශිලා ලිපියෙන් හඳුන්වන බැවිනි.[14] මහනුවර සමයේ සම්පාදිත වූයේ යැයි සැළකෙන නම්පොතේ විහාරස්ථාන නාමාවලියේ අංක 94 දරන ස්ථානයේ දැක්වෙන්නේ මේ ස්ථානය

10 එම. පි. 29

11 Sirisoma, M. H. 1983. P.3

12 එම.

13 EPIGRAPHIA ZEYLANICA. Vol. iv. 1934 - 1941. EDITE BY S. PARANAVITANA. ARCHAEOLOGICAL SURVEY OF CEYLON. COLOMBO. P. 151 - 160.

14 සෙනෙවිරත්න, අනුරාධ.- ලක්දිව වටදගේ, 1966. ගුණසේන, කොළඹ. පි.49

"නීතුපත්පාන" නමිනි.[15] බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේගේ විශුද්ධිමග්ගයෙහි ගිරිකණ්ඩ විහාරය පිළිබඳ පුවතක් දැක්වෙයි. ඒ මෙසේය. "තථා ගිරිකණ්ඩ විහාරස්ස උපනිස්සයෙ වත්තකාල ගාමෙ ඒකා කුලධීතා බලව බුද්ධාරම්මනාය උබ්බේග පීතියා ආකාසෙලඞගෙසි ........."[16] මෙහි දැක්වෙන පුවත කෙටියෙන් මෙසේය. එකල ගිරිකණ්ඩ විහාරය අසල වත්තකාල නම් ගමෙහි උපාසක උපාසිකාවකගේ ගැබ්බර දියණියක වූවාය. දෙමාපියන් ගිරිකණ්ඩ චෛතිය වැඳීමට යාමය සූදානම් වනවිට දියණිය ද එසේ ඒමට කැමැත්ත පළකළාය. ඇය ගැබිණියක බැවින් පර්වතය තරණය කිරීම අපහසු බව දැනගත් දෙමාපියෝ ඇගේ ගමන නවතා පියා ගිරිකණ්ඩ චෛතිය වැඳීමට නික්මුණා හ. දෙමාපියන් චෛතිය වැඳීමට ගිය පසු ගැබිණි දියණිය පර්වත මුදුනේ පෙනෙන චෛතියත් දැල්වෙන පහන් ද ගැවසෙන භික්ෂූන් ද දුටුවා ය. ඇයට මෙහි දී ඇති වූ බුද්ධාලම්බන ප්‍රීතිය හේතුවෙන් ඇය නොදැනීම ආකාශ ගතව චෛතිය මලුවට පැමිණියා ය. දෙමාපියෝ වෙහෙස මහන්සියෙන් එහි එන විට ඇය වඳිමින් සිටිනු දැක විමතියට පත් වූහ. දියණිය ආවේ කිනම් මඟකින් දැයි දෙමාපියන් විමසූ විට ඇය කියා සිටියේ අහසින් පැමිණි බවයි. අහසින් යන්නේ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා යැයි දෙමාපියන් පැවසූහ.

මේ ඓතිහාසික පුවත අනුව පෙනි යනුයේ අටුවා ලියැවෙන සමයේ දී ද ගිරිකණ්ඩ චෛතිය පූදබිමක්ව පැවති බවයි. මෙහි ඓතිහාසික තොරතුරු අතර වඩාත් ප්‍රසිද්ධ පුවත වන්නේ තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන්ගේ පුවතය. එය පූජාවලී කතුවරතුමා මෙසේ සඳහන් කරති. "ඒ වෙළඳ දෙබෑයෝ ස්වාමීනි තිති අප වැඳපුදා ගන්නා න්‍යායෙන් වස්තුවක් දුනමැනවැයි කීහ. ස්වාමිදරුවෝ ශ්‍රී හස්තයෙන් සිරස පිරිමැද කේශධාතු මිටක් ඔවුනට දුන් සේක. ඔහු රුවන් කරඬුවකින් ඒ කේශධාතු පිළිගෙන රථයෙහි තබා සිය නුවර ගෙන ගොස් පූජා කරන්නාහු කලෙක ජල යාත්‍රාවෙහි ඇවිද ශ්‍රී ලඞකාද්වීපයට පැමිණ දරපැන් සොයා

15 සිංහල ග්‍රන්ථාර්ණවය හෙවත් සිහළ ගත් සයුර. සම්පාදක. තලල්ලේ සිරි ධම්මානන්ද මහනාහිමි. 2004 (තෙවන මුද්‍රණය) සමයවර්ධන, මරදාන. පි. 21

16 විශුද්ධිමග. සංස්. බෙන්තර සද්ධාතිස්ස හිමි. දීපාරාම දූවේ විහාරය, 1949. කළුතර. පි. 347



ගිරිහඬු බැස ද කරඬුව ගලපිට තබා බත් පිස කා යන කල ද කරඬුව තැබූ පලින් සොලවා ගත නොහී මේ උත්තම ස්ථානයක් වනැයි දැන පාෂාණ ගොඩකින් වසා ගඳ දුම්මල් පුදා ගියහ. පසුව එතන ගිරිහඬු නම් වෙහෙරක් විය."[17] තිරියාය වටදාගෙය ආශ්‍රිත පුරාවස්තු, නටඹුන් ද සාහිත්‍යම තොරතුරු ද ශිලාලේඛන මූලාශ්‍ර ද අනුව මෙහි ඉතිහාසය ක්‍රිස්තු පූර්ව දෙවන සියවස සිට ක්‍රිස්තු වර්ෂ දහඅටවන සියවස දක්වා පෙළ ගැසෙන බව දක්නට ඇත. මෙයින් වඩාත් පර්යේෂණයට සහ විචාරයට ලක්ව ඇත්තේ එහි වූ වටදගෙය සහ සංස්කෘත භාෂාවෙන් රචිත පර්වත ලිපියයි.

## තිරියායි පර්වත ලිපිය -

ශ්‍රී ලංකාවේ පැරණි ශිලාලේඛන මේවන විට දහස් ගණනක් සොයාගෙන ප්‍රකාශයට පත්ව තිබේ. ඒවා අතුරින් සංස්කෘත ශිලාලේඛන ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි. පල්ලව ග්‍රන්ථාක්ෂරයෙන් ලියැවී ඇති තිරියායි ගිරි ලිපිය ඉන් එකකි.[18] මේ වනතුරු ලැබී ඇති සංස්කෘත ලිපි සියල්ලම මහායාන අදහස්වලින් යුක්තය. ක්‍රි.ව. 6 - 9 ශතවර්ෂ අතර ලියූ ලිපිවලින් මිහින්තලය ඉදිකටු සෑය ලිපියේ මහායානිකයන් ගේ ශ්‍රේෂ්ඨ ග්‍රන්ථයක් වූ චතුස්ත්‍රිංශත්ප්‍රඥා පාරමිතාව ලියා ඇත්තේ ය. මිහින්තලයේ අම්බස්තලය අසළින් සොයා ගත් ත්‍රිකායස්තව ලිපිය ශ්‍රද්ධරා නම් වෘත්තයෙන් ධර්මකාය සම්බෝගකාය සහ නිර්මාණකාය වර්ණනා කරමින් ලියන ලදී. වංශස්ථ හා උපජාතිවෘත්තයෙන් ලියූ ශ්ලෝක එකොළහකින් යුත් තිරියායි ලිපිය මහායාන මන්තරයන්ගෙන් අනූන ය.

අවලෝකිතෙශ්වර - මංජු ශ්‍රී නම් ප්‍රධාන බෝධිසත්වවරයන් ද සඳහන්වන මේ පද්‍යයන්ගෙන් ගිරිකණ්ඩික (ගිරිහඬු) චෛත්‍ය නමස්කාරය දැක්වේ. තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් කේශධාතූන් නිදන්කොට මේ චෛත්‍ය කරවන ලද බැවින් ඉතිහාසය

17 පූජාවලිය. සංශෝධක වේරගොඩ අමරමෝලි හිමි, 1953. රත්නාකර මුද්‍රණාලය. (කොළඹ ?) පි. 206

18 සද්ධාමංගල කරුණාරත්න. ලංකාවේ සංස්කෘත ශිලාලිපි ශාස්ත්‍රීය සංග්‍රහය 1991. සංස්. ආචාර්ය හොරණ වජිරඥාන හිමි සහ තවත් අය....... ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම. කොළඹ. පි. 20

අතීත් ද මෙහි වටිනාකමක් ඇත්තේ ය.[19] එකී ශිලා ලේඛනයට අයත් සංස්කෘත ශ්ලෝක එකොළස සතරපද පද්‍යානුසාරයෙන් එහි ම අන්තර්ගත කැර තිබෙයි.[20] තිරියායි ගිරිලිපිය මුලින්ම 1936 දි ආචාර්ය පරණවිතාන විසින් එපිග්‍රැපියා සෙයිලනිකා සඟරාවේ පළ කිරිමෙන් අනතුරුව එවක දඹදිව ශිලාලිපි විශේෂඥ ආචාර්ය බී. සී. එච්. ජොබ්‍රා විසින් එම සඟරාවේම නැවත ප්‍රසිද්ධකර ඇත. ඔහු එය නරදත්ත වෘත්තයෙන් බැඳුණු පද්‍ය ලිපියක් බව අනාවරණය කළේය.[21] ආචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ විස්තරාර්ථ සහිත ලිපියෙහි දැක්වෙන[22] සංස්කෘත ගද්‍යමය ස්වරූපය පද්‍යානුසාරිව ආචාර්යජොබ්‍රා විසින් ඉංග්‍රීසි රෝමන් අක්ෂරයෙන් පළකළ අතර[23] එය සිංහලාක්ෂර පද්‍යයෙන් මහාචාර්ය පූජ්‍ය මොරටුවේ සාසනරතන හිමි විසින් පළකරන ලදී.[24] ආචාර්යසෙනරත් පරණවිතානයන් විසින් පළ කරන ලද රෝමන් අක්ෂරයෙන් යුත් ශිලාලේඛන පෙළ සිංහලාක්ෂරයෙන් පළව තිබෙයි.[25] එහි සංක්ෂිප්ත අදහස මෙසේ ය. "අහස් ගංගාවේ හටගත් පද්මපත්‍රයෙන් කළ ගොටුවලින් පුරවන ලද සුගන්ධ ජලය ගත්තා වූ ද හස්තයෙන් ගන්නා ලද පුෂ්ප ධූප මිණිපහන් ආදී පූජා භාණ්ඩ ඇත්තා වූ ද දිව්‍ය ස්ත්‍රීහු ලාලිත්‍යයෙන් යුක්තව සුරපුරයෙන් බැස ගිරිකණ්ඩියෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේට සතුටු සිතින් පුදති.සුරපති තෙමේ ද අනේක පරිවාර සුරයන් පිරිවරා ගත්තේ සුලලිත දිව්‍යසංඛ, පටන ආදිය වයමින් අවුත් දිව්‍ය වෘක්ෂයෙහි හටගත් නව මල්කැන් විසුවරමින් උතුම් ගිරිකණ්ඩියෙහි පිණිපා කෙරෙමින් සුචරිතයෙහි හැසිරෙයි.[26] සංස්කෘත ශ්ලෝක එකොළහ

19 සාසනරතන හිමි, මොරටුවේ.- ලක්දිව මහායාන අදහස් තෙවන මුද්‍රණය 1999. විසිදුනු, බොරලැස්ගමුව. පි. 375

20 එම. පි. 400 - 401

21 සද්ධා මංගල කරුණාරත්න, 1991. පි. එම.

22 E. Z. Vol. iii P. 151 - 160

23 E. Z. Vol. iii P. 314 - 316

24 සාසනරතන හිමි, මොරටුවේ. පි. 400 - 401

25 සෙනෙවිරත්න, අනුරාධ. ලක්දිව වටදගේ, 1966. ගුණසේන, කොළඹ. පි. 53 - 54

26 එම. පි. 54



ඒ ඒවාට අයත් සිංහල පරිවර්තනය සමග මෙසේ ද පළව තිබෙයි.[27]

1. අවිරත භකතියුකත හෘදයෙ රවදාතගුණෛඃ
ප්‍රථමතර ප්‍රදාණ ගුණ (මුර්ක්ති) හිරෙක ගුරෞ
භගවතී ශාක්‍යරාජ තිලකෙ සුගතෙ සුතරා
මධිගත ධාතු (රු) ජ ජවලති සම්මුඛ එව මුනෞ

අවිරත භකතියුකත හෘදයෛඃ, භක්තියෙන් බැහැර නොවු හෘදය ඇති, අවදාත ගුණෛඃ, පිරිසිදු ගුණ ඇති, එකගුරෞ, අසහාය ගුරු වූ, භගවති, භාගවත් වූ, ශාක්‍ය රාජතිලකෙ, ශාක්‍ය රජවරුන්ට තිලකයක් වැනි වූ, සුගතෙ, සුගතයන් වහන්සේ කෙරෙහි, ප්‍රථමතර ප්‍රදාන ගුණ (මුතීති) හිඃ, පළමුවෙන්ම දන්දීම් සංඛ්‍යාත ගුණයෙන් මූර්තිමත් වූ දෙබෑවෙළඳුන් විසින්, මුනෞ සම්මුඛෙ එව, බුදුන් හමුයෙහිම, අධිගතධාතුඃ, ලබන ලද ධාතුන් වහන්සේ, ජ්වලති, බබලයි.

2. (ශ) ලිලනීධි ප්‍රයාණ වතුරෛඃ ක්‍රයවික්‍රයිහිඃ
බහුවිධ යාන පාත්‍ර පරිපූරිත භාණ්ඩශතෛඃ
කුශලවශාත් සහාය දෙවතයාපි සදා
භවති (භ) විෂ්‍යදල්ප ගිරිකණ්ඩික මිත්‍යුදිතෙ

ශලිලනීධි ප්‍රයාණවතුරෛඃ සමුද්‍ර යාත්‍රාකරණයෙහි දක්ෂ වූ,බහුවිධ යාන පාත්‍ර පරිපූරිත භාණ්ඩශතෛඃ, බොහෝ වූ නැව් නමැති භාජනයෙහි පුරවන ලද සියගණන් බඩු ඇති, ක්‍රයවික්‍රයිහිඃ, වෙළෙන්දන් සමග,කුශලවශාත් -(ඔවුනගේ) පින හේතුකොට ගෙන, සදා සහය දෙවතයා අපි, සියලු කල් හි සහාය දෙවිඳුවක් විසිනුත්, භවිෂ්‍යාත්, අනාගත කාල යෙහි, අල්ප ගිරිකණ්ඩිකං, කුඩා ගිරිකණ්ඩික නම් චෛත්‍යයක්, භවති ඉති, වේයයි, උදිතෙ, කියූ කල්හි.

3. (සලි) ලනිධි (සෙඨඃ) සමවතීයඃ සමෙතගුණෛ
රූපගත නාගරාජ සහිතෛ රූපශාන්තතරෛඃ
ත(දපි) වණිගගණෛඃ කෘතමිදං ප්‍රවිභාතිමුදා
වරගිරි ක (ණ්ඩි චෛ) ත්‍ය මිතියත් ප්‍රථිතම්භුවනෙ

27 මේධානන්ද හිමි, එල්ලාවල.

ජලනිධි සෙඨඃ, සමුද්‍රයෙහි ස්ථිත වූ, සමෙතගුණෙඃ, ගුණයෙන් යුක්ත වූ, උපගත නාගරාජ සහිතෙඃ සමීපයට එළඹි නාගරාජයන් සහිත වූ, රූපශාන්තතරෙඃ, අතිශයින් ශාන්ත වූ, වණිගගණෙඃ, වෙළඳ ගණයන් විසින්, මුදා සතුටින්, කෘතමිති, කරන ලද්දේ යයි යත්, යම් හෙයකින්,භුවනෙ ප්‍රථිතඃ, ලොකයෙහි ප්‍රසිද්ධ වීද, තත් ඉදං ගිරිකණ්ඩි චෛත්‍යම්, ඒ මේ ගිරිකණ්ඩි චෛත්‍යම්, ඒ මේ ගිරිකණ්ඩි චෛත්‍ය, ප්‍රවිභාති, බබලයි.

4. ....... (ස) කල මාවෘත මම්බුරුහ
   ප්‍රකර කෘතොපහාර රුචිරාඞගන භූමිතලම්
   සතතමභි ප්‍රසන්න නරමණ්ඩල භක්තිනතං
   වරගිරිකණ්ඩි චෛත්‍යමභී න ම්‍යකරොමී නතිම්

.........(ස) කලං ආවෘතම් (මුල් අකුරු නොමැති හෙයින් මෙහි අර්ථය නොවැටහේ).අම්බුරුහ ප්‍රකර කෘතොපහාර රුචිරාංගන භූමිතලම්, නෙලුම් මල් සමූහයෙන් කරන ලද පූජාවන් කරණකොටගෙන මනොඥ වූ මිදුලක් වූ භූමිතලයක් ඇති,සතතං අභිප්‍රසන්න නරමණ්ඩල භක්තිනතං, නිරතුරු සන්තෝෂ වූ මනුෂ්‍ය සමූහයා විසින් භක්තියෙන් නමස්කාර කරන ලද, වරගිරිකණ්ඩික චෛත්‍යම්, උතුම් ගිරිකණ්ඩික චෛත්‍යයට, අභිනම්‍ය, නැමී, නතිංකරොමි, නමස්කාර කෙරෙමි.

5. මකු (ට) මණෞ කෘත ස්ඵුට මගාමුනි බිම්බධරො
   නිවසති යත්‍ර සිඬ සුර කිනනර පූජ්‍යතමඃ
   ගුරුරවලොකිතෙශ්වර ඉති ප්‍රථිතො භගවාන්
   තදහරහර් නමාමි ගිරි කණ්ඩික චෛත්‍යමහම්

මකු (ට)මණෞකෘත ස්ඵුට මහාමුනි බිම්බධරඃ, කිරීට මාණික්‍යයෙහි කරන ලද ව්‍යකත වූ මහා මුනීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රතිමාව දරන, සිඬ සුරකින්නර පූජ්‍යතමඃ, සිඬ දෙව කින්නර යන මොවුන් විසින් වැඳියැ යුතු වූ, ගුරුඃ, තුන් ලොවට ආචාර්ය වූ අවලොකිතෙශ්වර ඉති ප්‍රථිතඃ භගවාන්, අවලොකිතේශ්වර යයි ප්‍රසිඬ භගවත් තෙමේ, යත්‍ර නිවසති, යම් තැනෙක වෙසෙයි ද, අහං, මම, තද්ගිරිකණ්ඩික චෛත්‍යම්, ඒ ගිරිකණ්ඩික චෛත්‍යය. අහරහර්, දිනපතා, නමාමි, වඳිමි.



6. මුනිරපි මඤ්ජුවාග් මදන දොෂ විෂාදහරඃ
   කණක විභූෂණො (ජව) ල විචිත්‍රගාත්‍ර රුචිර්
   නියත මුපෛති යත්‍ර සුකුමාර තනුර්භගවාන්
   තදහමපි ප්‍රණෞමි ගිරිකණ්ඩික චෛත්‍යවරම්

මදනදොෂ විෂාදහරඃ අනඞග දෝෂයෙන් වූ ජඩත්වය දුරුකරන, කණක විභූෂණ උජ්වල විචිත්‍රගාත්‍ර රුචිඃ, රන් අබරණින් බබලන විසිතුරු ශරීරකාන්තිය ඇති, සුකුමාර තනුඃ, සිවුමැලි සිරුරක් ඇති, භගවාන්, භාග්‍යවත් වූ මඤ්ජුවාග් මුනිඃ අපි, එනම් මුනි තෙමේත්, නියතං, නිශ්චය වශයෙන්, යත්‍රඋපෛති, යම් තැනෙකට පැමිණේද, තද්ගිරි-කණ්ඩික චෛත්‍යවරම්, ඒ උතුම් ගිරිකණ්ඩික චෛත්‍යය, අහං අපි ප්‍රණෞමි, මමත් වඳිමි.

7. සුරසරිද බ්ජ පණ්ණපුට පූරිත ගන්ධජාලාඃ
   කරභෘත පුෂ්ඵධූප මණිදීපනි වෙද්‍යධරාඃ
   සළලිත මඞගනා සසු රපුරාදවතීයර්මුදා
   විධදති පූජානං භගවතො ගිරිකණ්ඩිජුෂාඃ

සුරිසරිද් අබ්ජ පණ්ණපුට පූරිත ගන්ධජාලාඃ, ආකාශ ගංගාවෙහි වූ නෙලුම් පත්‍රවලින් සාදන ලද ගොටුවල පිරවූ සුවඳ ජලය ඇති කරභෘත පුෂ්පධූප මණිදීප නිවෙද්‍යධරාඃ, අතින් ගන්නා ලද මල් සුවඳ දුම් මැණික් පහන් නිවෙද්‍ය යන මේවා දරන්නා වූ,අඞගනාඃ, දෙවඟනෝ, සලලිතම්, ලීලා සහිතවූ, සුරපුරාද් අවතීයර්, දෙව්ලොවින් බැස, ගිරිකණ්ඩි ජුසාඃ, ගිරිකණ්ඩියෙහි ප්‍රීතියෙන් වසන්නා වූ, භගවතො, භාග්‍යවත්හට,පූජානංවිධදති, පූජා කෙරෙත්.

8. සුරපතිරප්‍යනෙක පරිවාර සුරානුගතඃ
   සලලිත දිව්‍යශඞඛ පටහ ප්‍රණිධානුගතඃ
   සුරතරු සම්භවාර්ද කුසුමප්‍රකරං විකිරන්
   වරගිරි කණ්ඩිකෙ ප්‍රණිපතන් කුරුතෙසුකෘතංතම්

සලලිත දිව්‍යශඞඛ පටහ ප්‍රණිධානගතඃ ලීලා සහිත වූ දෙව් ශඞඛදෙව් බෙර යන මොවුන්ගේ උසස් නාදයෙන් යුක්ත වූ, අනෙක පරිවාර සුරානුගතඃ සුරපතිඃ අපි, නොයෙක් පිරිවර

වූ දෙවියන් විසින් අනුගත ශක්‍රදිව්‍යරාජයා ද, සුරතරු සම්භව ආර්ද්‍ර කුසුම් සමූහය ඉසිමින්, වරගිරි කණ්ඩිකෙ ප්‍රණිපතත්, උතුම් ගිරිකණ්ඩික සෑයෙහි බසිමින්, තම්සුකෘ-තං කුරුතෙ, ඒ වැඳීම් සඞඛ්‍යාත සුකෘතය කෙරෙයි.

9. ප්‍රතිදින මච්‍යමාන මහධීහිරනෙ කශ (තෛඃ)
අවිරල සිංහලෙන්‍ද ජනකල්පිත පූජ්‍යශතම්
විෂයනිරීහ කාරණ මුපාසිත මායර්ශතෛ-
රහමපි පූජයාමි ගිරිකණ්ඩිගතං සුගතම්

අනෙකශතෛඃ, මහධීහිඃ ප්‍රතිදිනං අච්‍යමානං, නොයෙක් සියගණන් මහනුවණැත්තන් විසින් දිනපතා පූජා කරනු ලබන, අවිර සිංහලෙන්‍දජනකල්පිත පූජ්‍යශකම්, බොහෝ සිංහල රජවරුන් සහ (අවශේෂ) ජනයන් විසින් කරන ලද සිය ගණන් පූජනීය වස්තු ඇති, ආයර්ශතෛඃ, සියගණන් ආයර්යන් විසින්, උපාසිතං, සෙවුනාලද, විෂයනිරිහ කාරණං, පඤ්චකාම සම්පත්තිය පිළිබඳ ආශාවන්ගෙන් වෙන් විමට කරුණු වූ, ගිරිකණ්ඩිගතං සුගතම්, ගිරිහඩු ගතවූ සුගතයන් වහන්සේ අහං අපි පූජයාමි, මමත් පුදමි.

10. සකල තමොපහ මිභගවතො ද (ශ).........
වරගිරිකණ්ඩි චෛත්‍යනිලයෙ ප්‍රතිනිම්නධියා
........නුවනාමයද් භවත් කුශලම්, ප්‍රචිතම්
භවතු භවාබ්ධි දුඃඛ පරිහීණමනෙන ජගත්

සකලතමොපහං, සියලු අවිද්‍යාන්‍ධකාරය දුරු කරන්නා වූ, භගවතො ද (ශ)..... භාග්‍යවතුන් වහන්සේගේ ද (ශ)..... වරගිරිකණ්ඩි චෛත්‍යනීලයෙ, උතුම් ගිරිහඩු චෛත්‍ය ගෘහය වෙතැ, ප්‍රතිනිම්නධිය. නතුවු බුධිය කරණකොට ගෙන... නුවනාමයද් භවත්, ( මෙහි අර්ථය නොපැහැදිලිය) කුශලම් ප්‍රචිතම්, කුශලයක් රැස් කරන ලද්දේද, අනෙන, ඒ කුශලය කරණකොට ගෙන, ජගත්, ලෝකය තෙමේ, භවාබ්ධිදුඃඛ පරිහීණම් භවතු, සංසාරසාගර දුඃඛයෙන් මිදුනක් වේවා.

11. කෘතප්‍රති (ශ්‍ෙද).... ම.........
..........................................
ත්‍රපුෂ්‍යකෛර්වල්ලි කෙර්වණිග්ගණෛඃ
කෘතං කෘතාචෛගිගිරිකන්ඩි චෛත්‍යම



කෘතප්‍රතිශ්‍ෙද, කරන ලද ප්‍රතිඥා ඇති ...........කෘතාචෛඃ, කරන ලද කාර්ය ඇති, ත්‍රපුෂ්‍යකෛර්වල්ලි කෛර්වණිගගණෛඃ, ත්‍රපුෂ්‍ය වල්ලික යන දෙදෙනා පිළිබඳ වෙළඳ ගණයන් විසින්, ගිරිකණ්ඩි චෛත්‍යම්, ගිහඩු සෑය, කෘතම්, කරන ලදී.

පහත දැක්වෙන ශිලාලේඛනය අනුව පූර්වෝක්ත ලිපිය ලියූ සමය දැනගත හැකිය.එම ලිපියතිරියායේ වටදාගෙයට යන දර්ශනීය පියගැට පෙළ මැද කොටසේ මේ ලිපිය කොටා ඇත. සිංහල් රටේ අධිපති වූ සිලාමේඝ රජතුමාගේ 33 වන රාජ්‍ය වර්ෂයෙහි ලිපිය කොටා ඇති බව එහි කියවේ. මේ රජු හයවන අග්බෝ හැඩියට සැලකේ. පේළි දෙකකින් යුත් ලිපියකි.

1. සිං(හ) ළෙන්‍ද ශීලාමෙඝ මහා රාජස්‍ය
2. ත්‍රයෝවි (ං) ශතිමෙ වෂේ රාජෝ්‍යලිඛිතම්

සමාලෝචන.

මහායාන බුදුසමයට දිගු ඉතිහාසයක් ඇත. අශෝක යුගයෙන් පසු මධ්‍ය ඉන්දියාවේ මෙන් ම වයඹදිග ඉන්දියාවේ හටගත් දේශපාලන කලබල නිසා අවට පිහිටි රටවලින් නානා ගෝත්‍රිකයෝ ඉන්දියාවට පැමිණියා හ. චීනය, ග්‍රීසිය, පර්සියාව, අයිරාණය වැනි රටවලින් පැමිණි මේ ජාතීන්ගේ සභ්‍යත්වයෝ ඉන්දියානු සභ්‍යත්වය සමග සංඝට්ටනය වූහ. මෙසේ නානා රටවලින් පැමිණි නානා ගෝත්‍රිකයන් අතර ප්‍රමුඛස්ථානය හිමිවන්නේ ඇත පෙරදිගින් හෙවත් වයඹදිග චීනයෙන් පැමිණි කුශාන් වංශිකයන්ට ය. අශෝක රජුගෙන් පසුව ඉන්දියාවේ විසූ ශ්‍රේෂ්ඨ රජතුමා මේ කුෂාන් වංශයෙහි උපන් කණිෂ්ක රජ ය. මහායාන - හීනයාන යනුවෙන් බුද්ධාගම බෙදුණේ ද මේ රජු දවස ය. අශෝක රජ මෙන් ම මේ රජතුමා ද සංඝායනාවක් කරවීය.[28] බුදුසමයේ මහායාන සම්ප්‍රදයේ ආරම්භය පිළිබඳව විවිධ උගත්තු විසින් දක්වනු ලැබ ඇති අදහස් සංක්ෂිප්තව එසේ පළකිරීමට ගෞරවාර්හ මොරටුවේ සාසනරතනස්වාමීන්ද්‍රයාණන් වහන්සේ සමත් වූහ. උන්වහන්සේ සඳහන් කළ පරිදි එදා මෙදා තුර මහායාන

28 සාසනරතන හිමි, මොරටුවේ.- ලක්දිව මහායාන අදහස් නෙවන මුද්‍රණය 1999. විසිදුනු, බොරලැස්ගමුව. පි. 99

බුදුසමය ලෝකයෙහි බොහෝ ප්‍රදේශවල විකාශනය වූ අයුරුත් එහි වර්තමාන තත්ත්වයත් සුවිශේෂී ලේඛන රැසක් අනුසාරව කියැවීමේ අවස්ථාව උදාව තිබෙයි. හීනයානය මහායානය යනුවෙන් බුද්ධාගම දෙවදෑරුම් යයි සම්මතය. චිටගොන්, බුරුම, ලංකා, සියම් යන රටවල පවත්නා බුද්ධාගම හීනයාන යනුවෙන් ද, නේපාල, චීන, ජපන්, මොංගෝලීය යන රටවල පවත්නා බුද්ධාගම මහායානය යනුවෙන් ද හඳුන්වති. ඉන්දියාවට මධ්‍ය ස්ථානය දී ඉන්දියාවට දකුණින් පිහිටි රටවල බුද්ධාගම( - හීනයානය) දකුණු බුද්ධාගම යැයි ද උතුරින් පිහිටි රටවල බුද්ධාගම යයි ද කියති.[29] මහායාන සම්බන්ධ සාරසංක්ෂේපයක් බඳු පළකිරීමක් සම්බන්ධයෙන් තව ද එම මූලාශ්‍රය කියවීම වැදගත් ය. මහායාන දර්ශනය පිළිබඳව ඇති වූ විකාශයේ සංවර්ධනාත්මක අවස්ථාවක් ජාවා දූපතේ බෝරෝබුදූර් ස්ථානයේ ඇති බෞද්ධ ස්මාරකයෙන් මොනවට පැහැදිලි වන්නේ ය.[30] මහායාන සංකල්පයේ දශභූමි සිද්ධාන්තයත් බෝධිසත්ව සංකල්පයත් මහායාන පිළිගැනුමට අනුව බුද්ධ චරිතයත් ත්‍රිමාණරූපි ගල් කැටයම් මගින් ප්‍රකට කෙරෙන තවත් තැනක් ලොවෙහි එයට අමතරව තවත් නැත. ලලිත විස්තරයේ දැක්වෙන බුදුසිරිත කැටයම් පුවරු රැසක් මාධ්‍යය කරගනිමින් ප්‍රශස්ථ අයුරින් නිමවා තිබෙයි. ඒවා ක්‍රි.ව හත්වන අටවන සියවස් අතර ශයිලේන්ද්‍රසිං රාජ්‍ය සමයට අයත් යැයි විශ්වාස කරනු ලැබෙයි.[31] ලංකාවේ ප්‍රචලිත මහායාන සංකල්පය ආශ්‍රිත ඇදහිලි, පුදපූජා, සිරිත් ආදිය පිළිබඳව දුරාතීතයේ සිට ම විවිධ වූ තොරතුරු දක්නට ලැබෙයි. ඒවා හා සම්බන්ධ සාහිත්‍යයක් ද පුරාවිද්‍යා මූලාශ්‍රය විශේෂයක් ද විවිධ අයුරින් පැනෙයි. ලක්දිව මහායාන අදහස් මැයෙන් දිගු පරිච්ඡේදයක් සිය කෘතියෙහි අන්තර්ගත කිරිමට මොරටුවේ සාසනරතනස්වාමීන්ද්‍රයාණන් වහන්සේ උත්සුක වූහ.[32] එය මේ ආශ්‍රිත සාරගර්භ ලිපියක් සේ සැලකීම මැනවි.

[29] එම. පි. 350

[30] තිස්ස බණ්ඩාර, වයි. කේ. ඉන්දුනීසියානු බෞද්ධ ස්මාරක ආශ්‍රිත ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා වාර්තාව... අමුද්‍රිතයි.

[31] උක්ත චාරිකාවේ දී ස්ථානීය මාර්ගෝපදේශක විසින් දෙන ලද තොරතුරු අනුවය. මේ වෙනුවෙන් පුවරු රැසක් සහිතව පළකොට ඇති වාර්තා පොත ඉන්දුනීසියානු භාෂාවෙන් සම්පාදිතයි.

[32] සාසනරතන හිමි (1999). පි. 369-389



බුදුසමයේ මුල් අවධිය හා මහායානයේ ආරම්භය පිළිබඳව පැහැදිලි ඓතිහාසික විස්තරයක් කිරීම අපහසු වුවත් මහායාන හා හීනයාන දෙපස ගත් වෙනත් මතවාද හඳුනාගත හැකිය. කෙසේ වෙතත්, මෙම ප්‍රතිවාදවලට කේන්ද්‍ර වී ඇත්තේ විනය කරුණු නොව සංසාරය හා සංසාරයෙන් එගොඩවන මාර්ගය කෙසේ වියයුතු ද වැනි ධර්මමය කරුණු ය. සංසාරය හා අතර විශ්වමය සම්බන්ධයත්, බෞද්ධ ආධ්‍යාත්ම ගවේෂණයේ පරමාදර්ශ විය යුත්තේ මහායාන බෝධිසත්ව චර්යාව ද නැතහොත් ථේරවාදී අර්හත් චර්යාව ද ඒ අනුව බුද්ධත්වය යනු අර්ථකථනය කළ යුත්තේ කෙසේ ද වැනි ගැටලු පැන නැගුණු අතර මේ පිළිබඳව තියුණු මතභේද හා විකල්ප මාර්ග ඉදිරිපත් කරන්නට යෙදුණි. සිය අදහස් ඉදිරිපත් කිරීමේ දී මහායානිකයෝ සවිස්තර සංස්කෘත සූත්‍ර මගින් සිය අදහස් විචක්ෂණ අන්දමින් ඉදිරිපත් කළහ. මෙහි ලා හීනයානිකයන්ගේ අරහත් බව හා නිර්වාණය පිළිබඳ අදහස් සීමිත විදග්ධ නොවන ඒවා වශයෙන් උපහාසයට ලක් කරන ලදී. එබඳු එක් මහායාන මතයක් වන්නේ බුදුන් සදාතන බවත් කාලානුරූපව සද්ධර්මය ලොවට ප්‍රකාශ කරන බවත් ය.[33] ලංකාවේ බෝධිසත්ව වන්දනය ආශ්‍රිත ඓතිහාසික විකාශයේ තොරතුරු පර්යේෂණාත්මකව ඉදිරිපත් කරඇති මහාචාර්ය ජෝන් හෝල්ට් මහායාන සහ හීනයානයෙහි දාර්ශනික තත්ත්වය ද මැනවින් පෙන්නුම් කර තිබෙයි. නිර්වාණය පිළිබඳව හීනයානිකයන්ගේ සහ මහායානිකයන්ගේ මතය පරස්පර විරෝධ ය. නිර්වාණය භාවාත්මක ද නැතහොත් අභාවාත්මක ද යන උභය මතය උඩ හීනයානිකයෝ ද මහායානිකයෝ ද නානා සාධක දැක්වූහ. එය ම බෞද්ධ දර්ශනයේ ව්‍යාප්තියට ද හේතු විය. හීනයාන මහායාන පඬිවරුන් පමණක් නොව .........සමයවාදී අනිකුත් දාර්ශනික පඬිවරු ද නිර්වාණය පිළිබඳ නානා අදහස් දැක්වූහ. එබඳු ආචාර්ය මත විස්සක් ම එකකට එකක්වෙනස් ය. ඒ මතාන්තර විස්ස ම එකකට එකක් වෙනස් ය. එහි සඳහන් එක් මතයක් වන්නේ යොෂිත් කුලශාස්ත්‍ර පරිවර්තකයන් ස්ත්‍රිය පවා නිවන මෙන් සලකන ලද බවයි. තවත් මතයක ස්ත්‍රී පුරුෂ සංයෝගය පවා නිවන මෙන් සලකන ලදී. ලංකාවතාර සූත්‍රයෙහි

[33] හෝල්ට් ක්ලිෆර්ඩ් හෝල්ට්. මකුට මුනිධාරි අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය. පරි. පී.බී. මීගස්කුඹුර, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ, 1994. පි. 47

තෘතිය පරිච්ඡේදයෙහි ද, නිර්වාණය පිළිබඳ නොයෙකුත් මත දක්වා ඒ සියල්ලම ප්‍රතික්ෂේප කර නිර්වාණය ඇතැයි කියා හෝ නැතැයි කියා හෝ අන් විධියකින් හෝ විග්‍රහකර දැක්විය නොහැකි තත්ත්වයකැයි කීහ. නාගාර්ජුන ආචාර්යයෝ ද නිර්වාණය භාව අභාව දෙකින්ම තොර තත්ත්වයකැයි කීහ.[34] බුදුසමයෙහි මහායාන හා හීනයාන දෙ ආකාරයෙහි බහුවිධ සම විසමතා පවතින අයුරු විවිධ මූලාශ්‍රය කෙරෙන් පැහැදිලි වෙයි. මහායාන සංසිද්ධියේ බෝධිසත්ත්ව තත්ත්වය වඩාත් ප්‍රකට කෙරෙන කරුණු ඇත. බෝධිසත්ත්ව ශබ්දය මහායාන ධර්මයත් සමග ප්‍රභවය වූවක් යැයි බොහෝ දෙනා විශ්වාස කරති. එහෙත් බෝධිසත්ත්ව සංකල්පය මුල් බුදුසමය හා බැඳී පවතින්නක් සේ කල්පනා කළ හැකිය.

බෝධිසත්ත්ව ශබ්දයෙන් අදහස් කරන්නේ බුදුවරයන්ගේ අතීත ආත්මභාවයන් පිළිබඳව ය. පාලි ත්‍රිපිටකයට අනුව ගෞතම බුදුන්වහන්සේගේ පූර්ව ආත්මයන් බෝධිසත්ත්ව ආත්මභාවයන් බවත්, සුමේධ තාපස ව දීපංකර බුදුන් වහන්සේ වෙතින් නියත විවරණ ලැබූ බවත්, දැක්වේ. තමන් පළමුව බුද්ධත්වයට පැමිණ සෙසු සත්වයන්, පසුව සසර කතරින් එතෙර කරවමියි යන අධිෂ්ඨානය බෝධි චිත්තය ප්‍රභය වු බව සඳහන් වේ. මේ අනුව මුල් බුදුසමයෙහි බෝධිසත්ත්ව වාදයෙහි මූලික ලක්ෂණ පැවති බව දක්වයි. ථෙරවාදයෙහි එක් බෝධිසත්වරයෙකු ගැන පමණක් උගන්වනු ලැබේ. එනම් ගෞතම බුදුන්වහන්සේගේ අතීත ජන්මයක් ලෙස සැලකෙන බෝධිසත්ව ජීවිතයයි. ථෙරවාදීන්ගේ ඉගැන්වීම්වලට අනුව බුද්ධත්වය අතිශය දුෂ්කර වූවකි. එබැවින් සම්‍යක් සම්බුද්ධරාජයාණන් වහන්සේගේ අනුශාසනය අනුව සියල්ලෝම රහත් භාවයෙන් නිවන් පසක් කළ යුතුයැයි ථෙරවාදි බුදුදහමේ අනුශාසනාවයි. එහෙත් මහායානයේ අර්හත් භාවයට වඩා බුද්ධත්වය උසස්කොට සලකා බුද්ධත්වය සඳහාම අනුශාසනා කරනු දැකිය හැකිය. ඒ බැවින් බුද්ධත්වය පතා වීර්‍ය්‍ය වඩන සියල්ලෝම නිරතුරුව ක්‍රියා කිරීම බෝධිසත්වවරුන්ගේ පරමාදර්ශී ලක්ෂණය විය. ථෙරවාදීහු (හීනයාන) ප්‍රඥාව පමණක් ප්‍රගුණ කරන

[34] සාසනරතන හිමි (1999). පි. 318



අතර බෝධිසත්ව පරමාදර්ශයෙන් මහා ප්‍රඥාව හා මහා කරුණාව නිරූපිත වේ. මහායාන සම්ප්‍රදයට අනුව බෝධිසත්වයන්ට ත්‍රිකායක් ඇත. මනෝකාය, සම්බෝගකාය, නිර්මාණකාය යනුයි.[35] බෝධිසත්ව සංකල්පයෙහි ඓතිහාසික විකාශය අනුව පෙනී යනුයේ හීනයාන හා මහායාන යන සම්ප්‍රදය දෙකෙහි ම මෙම තත්ත්වය පිළිගෙන තිබුණු බව ය. ඉන්දියාවෙන් ලංකාවට ලැබුණු මහායාන බුදුසමයේ මුල් අවදියේ සිට ම බෝධිසත්ව සංකල්පය පුද පූජාවට පාත්‍ර වූ බවට බොහෝ සාධක එලවයි. ප්‍රධාන වශයෙන් ම බෝසත් පිළිම වන්දනය ඒ අතර මුල් තැනක් ගනී. පුරාවිද්‍යාත්මක අගයක් ඇති විවිධ මාධ්‍යයෙන් හා විවිධ ප්‍රමාණයෙන් නිර්මිත බෝසත් ප්‍රතිමා රැසක් දිවයින සතු වෙයි. මේ සංකල්ප ඇසුරෙන් ලියැවුණු සාහිත්‍යයක් ද මේ දිවයිනේ තිබෙයි. අභිලේඛනමය සාදක ඇසුරෙන් ලක්දිව බෝධිසත්ව සංකල්පය සඳහා නිදසුන් කීපයක් ම ඇත. ඒවා තඹපත්, රන්පත්, සහ ශිලාලේඛන වශයෙන් විවිධ වෙයි. සංස්කෘත භාෂාවෙන් ලියැ වී ඇති අභිලේඛන 17ක් පිලිබඳ විස්තර වාර්තා වන්නේ ය.[36] ඒ අතර තිරියායි ගිරි ලිපියතුන්වන අංකය යටතේ දැක්වෙයි. මතු දැක්වෙන පරිදි එකී ලිපිය ගැන සංක්ෂිප්තව එහි සඳහන් ය. "තිරියායි වටදගෙය ත්‍රිකුණාමලයට සැතපුම් 29ක් උතුරින් පිහිටා ඇත. එම වටදගෙය තිබෙන උස් ගල්පර්වතයේ එක් පැත්තක 7වන හෝ 8වන ශතවර්ශයට අයත් පල්ලව ග්‍රන්ථාක්ෂරයෙන් මෙම ලිපිය කොටා ඇත. එය මුලින් ම 1939 දී ආචාර්ය පරණවිතාන විසින් එපිග්‍රැපියා සෙයිලනිකා සඟරාවේ පළකිරීමෙන් අනතුරුව එවක දඹදිව ශිලාලේඛන විශේෂඥ ආචාර්ය බී. සී. එච්. ජොබ්‍රා විසින් එම සඟරාවේ ම නැවත ප්‍රසිද්ධ කර ඇත. ඔහු එය නර්දටක වෘත්තයෙන් බැදුණු පද්‍ය ලිපියක් බව අනාවරණ කළේ ය. එහි පළමුවන ශ්ලෝකය මෙසේ ය.

[35] චන්ද්‍රසිරි හිමි, ලියනේගම.- ලක්දිව අභිෂේක මංගල්‍යය. කොළඹ: ගොඩගේ, 2007. පි. 87 - 88

[36] ලංකාවේ සංස්කෘත ශිලාලිපි.-සද්ධාමංගල කරුණාරත්න.ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ශාස්ත්‍රීය සංග්‍රහය.සංස්. ආචාර්ය හොරණ වජිරඥාන හිමි සහ තවත් අය....... ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම. කොළඹ : (1991) පි. 17-24

අවිරති - භක්ති - යුක්ත හෘදයෛරවදත ගුණෛඃ
ප්‍රථමතර - ප්‍රදන - ගුණ මූර්ත්තිහිරෙක ගුරෞ
භගවති - ශාක්‍ය - රාජ තිලංක සුගතෙ සුතාරම්
අධිගත - ධාතුයො - ජ්වලති සම්මුඛමේව මූනෞ, යනුයි.

ආචාර්ය සෙනරත් පරණවිතාන දක්වන පරිදි මෙම ලිපියට අඩි 20ක් දිග හා අඩි 11ක් පළලින්යුත් ගලෙහි රළු මතුපිට ලියා ඇති පේලි 11ක් අයත් වන්නේ ය.[37] අව්ව, වැස්ස, සුළඟ ආදි ස්වභාවික තත්ත්වයන්ට හසුව දැනට වසර 1300ක් පමණ කල් ඉකුත් ව ඇති මේ අගනා සංස්කෘත ශිලාලේඛනයේ පෙළ ආචාර්ය පරණවිතානයන්ට අනුව මෙසේ ය.

1. ......... (අ) විරත-භක්ති-යුක්ත-හෘදයෛර් අවදත ගුණෛහ් ප්‍රථමතර- ප්‍රදන ගුණ- .......... හිර්-එක-ගුරෞ භගවති සාක්‍යරාජාතිලකෙ සුගතෙ සුතරම් අධිගත-ධාතු ගු........ති-සම්මුඛම්-එවම්අ

2. ......... (ස) ලිලනිධි ප්‍රයාණ-චතුරෛහ් ක්‍රය වික්‍රයිහිඃ බහුවිධ-යානපාත්‍ර- පරිපූපිත භාණ්ඩ (ත) තෛතඃ කසල වසාත් සහායනිජ-දෙවතයා ......... (භවති) (හ) විශ්‍යද් අලප .........කම් ඉති-උදිතෙ

3. ......... (සලි) ලනිධි......... (ස්ත හ) සමවතිර්ය. ෂ මෙතගුණෛර්-උපගත-නගර-ජ (න)-සහිතෛර් උපශාන්තතරෛහ් (සචෛර්) වණිග්-ගණෛහ් කෘතවද් අප්‍රවිහත මුදු වර ගිරික (ණ්ඩික-චෛත්‍යයම් ඉ) ති යත් ප්‍රථිතම්-භුවනෙ

4. ..........ම.........හ..........කර-කෘතොපහාර රුචිරාංගණ-භූමි-තල (මි) සතතං අභිප්‍රසන්න නර-මණ්ඩල-භක්තිනත-වර-ගිරිකණ්ඩි (ක-චෛ) ත්‍ය (මි අ) හිනම්‍ය.........



5. ම.........(කත) සප්‍රය මහා මුනිර්බ් බුද්ධාඞකරො නිවසති යත්‍ර සදසුර-කින්නර පූජ්‍යත (ෙ) ම (ා) ගුරුර් අවලොකිතෙශ්වර ඉති ප්‍රථිතො භගවාන් තං ගිරිකණ්ඩක චෛත්‍යම් අහම් අ (පි) ............

6. මුනිර් අපි මඤ්ජු-වාග් මනො දොසො විස දහර......... කනක-විභූසඥනොජ්වල විචිත්‍රිත ගාත්‍රා රුචින් නියතම් උපෛතියත්‍ර සුකුමාර තනුර් භගවාන් තද් අහං අපි ප්‍රනෞමි ගිරිකණ්ඩික චෛත්‍ය වරම්................

7. සුර සරිද්-අබ්ජ-පර්ණ පුත පූරිත ගන්ධජල............කර භෘත පුෂ්‍ය-ධූප මණි-දීප (නි) වෛද්‍ය-ධරාහ් සුලලිතම් අංගනා (ස්) සුර-පුරාද්-අවර්තීය මුදු විදධති පූජානි භගවතො ගිරිකණ්ඩි...............

8. සුර පතිර් අප්‍යනෙක පරිවාර සුරා නුගතහ් සුලලිත දිව්‍ය සංඛා පනහ (ප්‍රණි)......... සුර තරු සම්භවාර්ධ්‍ර කුසුම ප්‍රකරම් විකිරං වර ගිරිකණ්ඩිකෙ ප්‍රතිපාතම් කුරුතෙ.......... ......කත.........

9. ප්‍රතිදිනම් අර්චමාන (මි) මහා ශිරෞ............. (අ) විරල සිංහලෙන්ද්‍ර ජන කල්පිත පූජ්‍ය සත............. විශයම් නිරීති කරණ මි උපාසිතම් ආර්ය ගනෛ ර් අහම් අපි පූජයාමි ගිරිකණ්ඩි-ගත සුගත.........

10. සකල- තමො පහම් භගවතො ද ......... (වර)ගිරිකණ්ඩි චෛත්‍ය-නිලයෙ ප්‍රතිනීමත-ධියා.........යද්.........කුසලම් ප්‍රචිතම් භවතු භවාබ්ධි-දූඃඛ පරිහීණම් අනෙන ජගතහ්.............

11. කෘත-ප්‍රති............. යනෙ ත්‍රපුස්සකෙ චි වල්ලිකෛර්ව වනිග් ගනෛහ් කෘත......... (ග්) ගිරිකණ්ඩි-චෛත්‍යම් අභාව ස්වභාවාස් සර්ව ධර්මහ්ඃ

එසේ දැක්වෙන පෙළ පද්‍යානුසාරව ඉහත දක්වන ලදි.

---

[37] EPIGRAPHIA ZEYLANICA. Vol. iv. 1934 - 1941. EDITE BY S. PARANAVITANA. ARCHAEOLOGICAL SURVEY OF CEYLON. COLOMBO. P. 151.

මේ ලිපියේ සංයුතියට අයත් පාඨයන් හී සංක්ෂිප්ත අර්ථය මෙසේ ය. "බුදුරජාණන් වහන්සේගේ ආදිතම දයකයන් වූ තපස්ස භල්ලුක යන වෙළඳ දෙබෑයන්ට උන්වහන්සේගේ කේශධාතු ලැබුණු බව බුද්ධ චරිතයේ එයි. ඔවුන් ශ්‍රී ලංකාවට ගොඩබැස මෙම ස්ථානයේ ධාතු නිදන් කළ බවත් නාවිකයන් පිරිසක් විසින් එතැන ගිරිකණ්ඩ චෛත්‍ය සැදූ බවත් ය. මෙයට අමතරව තවත් අදහසක් මෙසේ ය. "අහස් ගංගාවේ හටගත් පද්ම පත්‍රයෙන් කළ ගොටුවලින් පුරවන ලද පුෂ්ප ධූප මිණිපහන් ආදි පූජාභාණ්ඩ ඇත්තා වූ ද දිව්‍ය ස්ත්‍රීහු ලාලිත්‍යයෙන් යුක්තව සුරපුරයෙන් බැස ගිරිකණ්ඩියෙහි වැඩ වසන භාග්‍ය වහන්සේට සතුටු සිතින් පුදති. සුරපති තෙමේ ද අනේක පරිවාර සුරයන් පිරිවරා ගත්තේ සුලලිත දිව්‍ය සංඛ, පටන ආදිය වයමින් අවුත් දිව්‍යවෘක්ෂයන්හි හටගත් නව මල් කැන් විසුරුවමින් උතුම් වූ ගිරිකණ්ඩියෙහි පිණිපා කෙරෙමින් සුචරිතයෙහි හැසිරෙයි." යන්නයි. තිරියායි සංස්කෘත ශිලාලිපියේ අවලෝකතේශ්වර - මංජු ශ්‍රී නම් ප්‍රධාන බෝධිසත්වවරයන් ද සඳහන්වන මේ පද්‍යයයන්ගෙන් ගිරිකණ්ඩික (- ගිරිහඬු) චෛත්‍යය නමස්කාරය දැක්වෙයි. තපස්ස භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් කේශධාතුන් නිදන්කොට මේ චෛත්‍ය කරවන ලද බැවින් ඉතිහාසය අතින් ද මෙහි වටිනාකමක් ඇත්තේ ය. මේ ලිපියේ සඳහන්වන එම බෝධිසත්වරු පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක ලැබීම අතිෂය විරළ ගනයේ සිදුවීක් සේ සැලකිය හැකි ය. ඒ මෙසේ ය. 1983 වර්ෂයේ අප්‍රේල් මස හයවැනිදා මේ ස්ථානයේ පුරාවිද්‍යා නේවාසික නිළධාරි ආර්. එම්. එදිරිසිංහ මහතාගේ සංරක්ෂණ කටයුතු අතරතුර ගල්පුවරුවක් ඉවත්කරනවිට ලෝකඩ ප්‍රතිමා රැසක් හමුවිය.[38] මෙම ප්‍රතිමා අතර බුදුපිළිම 31 සහ බෝසත් පිළිම 11 ද තාරා දේවතාවියගේ ප්‍රතිම තුනක් ද වූ බව වාර්තාවෙයි. බොසත් පිළිම අවලෝකිතෙෂ්වර සහ මංජු ශ්‍රී බෝසත්වරු නියෝජන කරති. මෙකී ප්‍රතිමා සියල්ල ලැබී ඇත්තේ පධානඝර ගොඩනැගිල්ලේ නටඹුන් ගල්පුවරුක් යටින් ය. ඒ එසේ තිබීමට හේතුව වන්නේ කිසියම් ආපදා සමයෙක ඒවා තිබූ තැනින් ආරක්ෂාව සඳහා සැඟවීමක් වියහැකි ය. මේ පුරාවස්තු අනුරාධපුර සමයේ ඒවා බව පැහැදිලි ය. බුදුපිළිම සහ සෙසු පිළිම ස්තූප ගර්භයේ තිබූ ඒවා වන්නට

38 Sirisoma. M.H. 1983,p.9



පුලුවනි. ආචාර්ය සෙනරත් පරණවිතාන දාගැබ සංරක්ෂණය කරනවිට ධාතු ගර්භයක් හෝ කිසිදු පුරාවස්තුවක් මෙහි නොතිබූ බව සඳහන්කර තිබීම අනුව පෙනී යන්නේ බොහෝ කලෙකට පෙර ඒවා එතැනින් කිසිවෙකු විසින් ඉවත්කරන ලදුව මතු ආරක්ෂාව සඳහා ඒවා සඟවා තබන්නට ඇති බව ය. තිරියායි පර්වත ලිපිය සහ එම පුදබිමෙන් ලැබී ඇති සෙසු පුරාවස්තු අනුව මෙහි එවක මහා්යාන සම්ප්‍රදායෙහි ඇදහීම වූ බව නිගමන කළහැකි ය. අදාළ ශිලාලේඛනයෙහි ඡායාපිටපතක් මෙහි බහාලනු ලැබෙයි.



(තිරියාය ශිලී)ලිපිය)